සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 4

විෂය - බුද්ධ ධර්මය

ශ්‍රේණිය - 5

2021 දෙසැම්බර් මාසය

සැකසුම : ඉරේෂා නිල්මිණී මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

# 25.පොළොන්නරු ගල් විහාරය

ආදරණීය දුවේ පුතේ අපි අපේ රටේ ඓතිහාසික ස්ථාන වන මහියංගණ දාගැබ සහ සෝමාවතී දාගැබ පිළිබඳ බොහෝ තොරතුරු ඉගෙන ගත්තා .

විදේශිකයන් පවා මවිතයට පත් කරන අසාමාන්‍ය නිර්මාණයක් වන පොළොන්නරුවේ ගල් විහාරය නරඹන්න යන්නයි හදන්නේ.

එහෙනම් බුද්ධ ධර්මය පෙළ පොත ගෙන අවසාන පාඩම පෙරලා ගන්නකෝ.

කෝ බලන්න නිදහස් තැනකට ගිහින් හඬ නගා කියවන්නකෝ.මගෙ පුතාලා දැක්කා නේද ගල් විහාරයේ තිබෙන හිදී පිළිම,හිටි පිළිම හා සැතපෙන පිළිම.

බලන්න බුදු ගුණ මතු කරමින් පොළොන්නරුව ගල් විහාරය නිර්මාණය කරලා තියෙන අපූරුව.හොඳයි,දැන් මගේ පුතාල බොහෝ තොරතුරු දන්නවානේ.එහෙනම් මගේ ප්‍රශ්න වලට පිළිතුරුත් ලියමුකෝ.

**ගැළපෙන පරිදි යා කරමු.**

| | |
|---|---|
| ➢ අනුරාධපුරය රාජධානියට පසු රාජධානිය | මහා පරාක්‍රමබාහු රජතුමා |
| ➢ උත්තාරාම විහාරය | ගල් විහාර කතිකාවත |
| ➢ ගල් විහාරය කරවූ රජු | පොළොන්නරුව |
| ➢ සැතපෙන පිළිමය | ගල් විහාරය |
| ➢ මහා පැරකුම්බා රජු කර වූ සෙල් ලිපිය | අඩි 46ක් දිගයි |

ඉතින් දුවේ පුතේ අපි ඓතිහාසික ස්ථාන කීපයක්ම හඳුනා ගත්තා.මෙම ස්ථාන අනාගත පරම්පරාව වෙනුවෙන් අපි ආරක්ෂා කර ගත යුතුයි.ඉතින් පුතේ අපේ ඓතිහාසික ස්ථාන නමින් පුංචි පොතක් හදමු නේද?